# මාසික මහ සභා රැස්වීම - 2022/06/15 දින

## අලව්ව ප්‍රාදේශීය සභාව

2022/06/15 වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 51 වන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**<u>මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා</u>**

1. ගරු සභාපතිනි - පද්මා වැත්තැව මැතිනිය
2. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ර්.එම් නිහාල් ඒකනායක මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී නලින් ධයස් රාජපක්ෂ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.ඒ ශ්‍රීයානි වසන්තා රත්නායක මැතිනිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ජයතිලක මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ර්.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා

**<u>මෙදින මහ සභාවට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා</u>**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 51 වන මහ සභා රැස්වීමට සපැමිණි අපේ සියලුම මන්ත්‍රිතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාත් අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ප්‍රධාන කොටගත් එම නිළධාරීන් ඇතුළු සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

## 01. 2022/05/24 දින මහ සභා වාර්තාව ස්ථිර කිරීම.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

2022.05.24 දින මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තාව ස්ථිර කිරීමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය**

ගරු සභාපතිතුමියනි, 2022.05.24 දින පැවති VI වන සැසිවාරයේ 50 වන මහ සභා රැස්වීම් වාර්තාව ස්ථිර කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන - නැත</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ගිය සභා වාරයේදී මේ සභාවේ සියළු පක්ෂ ඒකාබද්ධ වී යෝජනාවක් ලබා දුන්නා. එම යෝජනාව ගිය සභා වාරයේදී කතා නොකර ඊලඟ සභාවට දාන්න යෝජනා කලා. ඒ අවස්ථාවේදී ඔබතුමිය එය අනුමත කලා. නමුත් එම යෝජනාව සභාවට ඉදිරිපත් කල නොහැකි බව අපිට ලිපියකින් දැනුම් දී තිබෙනවා. එය ඔබතුමියගේ කරුණු දැක්වීම වුවත් සභාවේ නීතිරීතිවලටවත්, සභාවේ කටයුතුවලටවත් අනුව එය වැලැක්වීමට හැකියාවක් නොමැතියි. මොකද මෙය මන්ත්‍රීවරු බහුතරයක් යෝජනා කල දෙයක්. එමෙන්ම සභාවට අදාල දෙයක් එය අර්ථ ශූන්‍ය දෙයක් නොවෙයි. මේ රටේ දේපොල හානි වීමක් පිළිබඳව එයට විරුද්ධව මන්ත්‍රීවරුන්ට කතාකිරීමට අවශ්‍යයි. එයට මේ මන්ත්‍රීවරු දක්වන ප්‍රතිචාරය පිළිබඳව එළියේ මහජනතාව බලාගෙන ඉන්නවා. අපි මේ යෝජනාව ගෙන ආවේ ඒ සියල්ල හේතු කරගෙනයි. එම නිසා මෙම න්‍යාය පත්‍රයට එම යෝජනාව ඇතුලත් නොකිරීම සම්බන්ධයෙන් අපි විරෝධය පළකරනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

යෝජනාවක් පිළිබඳ යම් දැන්වීමක් න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීමට පෙර සභාපතිවරයා වෙත එය ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එය රීති විරෝධී බව ඔහුගේ මතය වේ නම්, ඒ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ යුතු යැයි ඔහු විසින් නියම කර, ඒ දැන්වීම කළ සභිකයාට ඒ බව දැනුම් දීමට සැලැස්විය යුතුය යනුවෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 1988 ප්‍රාදේශීය සභා (රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිළිබද කාර්ය පටිපාටිය) රීති හි අංක 11 (3) වගන්තියේ සඳහන් වී තිබෙනවා. ඔබතුමා ගිය සභා වාරයේදී ලිපිය ඉදිරිපත් කරලා එය ලබන සභා වාරයට කල් තබන බව ප්‍රකාශයට පත් කර වෙනත් කරුණු යටතේ එම ලිපියේ සඳහන් කර තිබෙන සියළුම කරුණු කතා කර තිබෙනවා. එම කතා කල සියළු දේ වාර්තාවට ඇතුලත් කර තිබෙනවා. ඒ වගේම මේ සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු ද දැන් සිදුවෙමින් පවතිනවා. පසුගිය සභා වාරයෙදී මේ සම්බන්ධයෙන් දිගින් දිගටම කතා කළා. මමත් මේ සම්බන්ධයෙන් පැහැදිලි කළා. ඒ නිසා මේ පිළිබදව නැවතත් සාකච්ඡා කිරීම අනවශ්‍යයි. ඒ සම්බන්ධයෙන් මම සියළු දෙනා වෙතම ලිඛිතව දැනුවත් කළා. න්‍යාය පත්‍රයට අනුව සභාව ගෙන යාමට මා කටයුතු කරනවා.

## 02. ගරු සභාපතිතුමිය විසින් කරනු ලබන විශේෂ නිවේදන

අලව්ව ප්‍රාදේශීය සභාව හා අලව්ව මහජන පුස්තකාලය එක්ව පොසොන් පොහොය නිමිත්තෙන් 2022.06.15 දින ප.ව. 01.00 සිට අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන පිවිසුම අබියස දී දන්සැලක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. ඒ සඳහා සහභාගී වන ලෙස ගරු මන්ත්‍රීතුමන්ලාට හා මන්ත්‍රීතුමියන්ලාට ගෞරවයෙන් ආරාධනා කර සිටිමි.

## 03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

### 03.1 අලව්ව එළහරක් මස් කඩය නවීකරණය කිරීම.

කේ.කේ.එම්. වත්ත, නසාර් මාවත, මල්ලවපිටිය ලිපිනයේ පදිංචි ඒ.ඩබ්. රවුෆ් මහතා විසින් යොමු කර ඇති ලිපියට අනුව අලව්ව එළහරක් මස් කඩය අවුරුදු 40 ක කාලයක් ප්‍රාදේශීය සභාවේ නීති රීති වලට අනුකූලව පවත්වාගෙන යන බවත් නියමිත දිනට පෙර මුදල් ගෙවා අවසන් කරන බවත් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ගේ සහ පාරිභෝගික මහතුන්ගේ ඉල්ලීම පරිදි ඔහු මෙම කඩය නවීකරණය කිරීමට අදහස් කරන බවත් ඒ සඳහා සහනයක් ලෙස 10% ක වාර්ෂික බදු වැඩිවීමේ පදනම මත වසර 03 ක කාලයක් සඳහා ඔහු වෙත ලබා දෙන ලෙසත් දන්වා ඇති අතර මීට පෙර ද ඔහු විසින් පවත්වාගෙන යන එළහරක් මස් කඩය සහ එළුමස් කඩය ඔහුගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් ලක්ෂ 1 ½ ක පමණ මුදලක් වැය කර නවීකරණය කල බව ද එම ලිපිය මගින් තවදුරටත් දන්වා ඇත.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

දැනට අපි මෙම එළ හරක් මස් කඩය ටෙන්ඩර් දීලයි තිබෙන්නේ. එය දැන් වෙනස් කල නොහැකියි. නමුත් දැන් ටෙන්ඩර් ඉදිරිපත් කරන කාලය පැමිණ තිබෙනවා. එම නිසා මෙම පුද්ගලයාට පමණක් නොවෙයි ඉල්ලන පුද්ගලයෙකුට නවීකරණය කර ගැනීමට අවස්ථාව ලබා දී අවුරුදු 03 ක කාලයකට ලබා දීම වඩාත් යෝග්‍ය වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම පුද්ගලයා විසින් එම එළහරක් මස් කඩය අවුරුදු 40 ක කාලයක් ප්‍රාදේශීය සභාවේ නීති රීතිවලට අනුකූලව පවත්වාගෙන යනවා. එමෙන්ම ප්‍රමාදයකින් තොරව අදාල මුදල් ගෙවා තිබෙනවා. මෙම ඉල්ලීමට අනුව එළහරක් මස් කඩය තමන්ගේ පෞද්ගලික වියදමෙන් අළුත්වැඩියා කරනවා නම් එවැනි ව්‍යාපාරිකයන්ට එක දිගට අවුරුදු 03 ක් හෝ 04 ක් ටෙන්ඩර් ලබා දීම වරදක් නෑ. ඒ අනුව අප සභාවේ කාර්මික නිලධාරී මහතුන්ගේ සම්පූර්ණ අධීක්ෂණය යටතේ අළුත්වැඩියා කටයුතු කිරීමේ එකඟතාවය මත ලබා දීමටත් එළ හරක් මස් කඩය ඉදිරියට බදු දීමේදී 10% ක වාර්ෂික බදු වැඩිවීමේ පදනම මත වසර 03 ක් සඳහා බදු ලබා දීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව කාර්මික නිලධාරී මහතුන්ගේ සම්පූර්ණ අධීක්ෂණය යටතේ අළුත්වැඩියා කටයුතු කිරීමේ එකඟතාවය මත ලබා දීමටත් එළ හරක් මස් කඩය ඉදිරියට බදු දීමේදී 10% ක වාර්ෂික බදු වැඩිවීමේ පදනම මත වසර 03 ක් සඳහා එකවර බදු ලබා දීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය.

**04.** <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත</u>

**05.** <u>යථා පරිදි කල් දී ඇති යෝජනා</u>

**(05-1)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/51 - 01** දරණ යෝජනාව</u>

අලව්ව ප්‍රධාන කාර්යාලය සඳහා මිලදී ගන්නා ලද Canon වර්ගයේ ඡායා පිටපත් යන්ත්‍රය සඳහා යොදන Canon NPG 84 Toner ශ්‍රී ලංකාවට ගෙන්වා බෙදාහරින බලයලත් නියෝජිත ආයතනය Metropolitan ආයතනය වේ. වෙළඳපොලේ පවතින වෙනත් Duplicate Toner යෙදීමෙන් ඡායා පිටපත් යන්ත්‍රයට හානි සිදුවිය හැකි බව එකී ආයතනය මගින් අප වෙත දන්වා ඇති බැවින් Canon NPG 84 Toner එහි බලයලත් නියෝජිත ආයතනය වන Metropolitan ආයතනය මගින් මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, වෙනත් ටෝනර් වර්ග යෙදීමෙන් ඡායා පිටපත් යන්ත්‍රයට හානි සිදුවිය හැකි බව දන්වා තිබෙනවා නම් එයට ගැලපෙන Canon NPG 84 Toner එහි බලය ලත් නියෝජිත ආයතනය වන Metropolitan ආයතනය මගින්ම මිලදී ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අවශ්‍ය ටෝනර් වර්ගය වෙනත් ආයතන වලත් තිබෙනවා නම් එම ආයතන වලින් මිල ගණන් කැඳවා අඩුම මිලට මිලදී ගැනීම සුදුසුයි. එසේ ලබා ගැනීමට වෙනත් ආයතන වල එම ටෝනර් වර්ගය නොමැති නම් පමණක් Metropolitan ආයතනය මගින් මිලදී ගැනීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව Canon NPG 84 Toner වර්ගය වෙනත් ආයතන වලත් තිබෙනවා නම් එම ආයතන වලින් මිල ගණන් කැඳවා අඩුම මිලට මිලදී ගැනීමටත් එසේ ලබා ගැනීමට වෙනත් ආයතන වල එම ටෝනර් වර්ගය නොමැති නම් පමණක් Metropolitan ආයතනය මගින් මිලදී ගැනීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය.

**(05-2)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/51 - 02** දරණ යෝජනාව</u>

අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් බෝයවලාන උප කාර්යාල භූමියේ ගෙවතු වගාවක් ආරම්භ කිරීමට අලව්ව ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලය යෝජනා කරන අතර කාර්ය මණ්ඩලය විසින්ම එකී වගා කටයුතු සිදු කිරීමට කැමැත්ත පල කර ඇත. ඒ අනුව එකී වගා කටයුතු සිදු කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය බීජ ලබා ගැනීමටත් වැය වන වියදම් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පවතින මහ සභාව කාරක සභාවක් බවට පත් කිරිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පවතින මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, පවතින කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පවතින කාරක සභාව මහ සභාවක් බවට පත් විය.

ඉහත කාරක සභා අවස්ථාවේදී අදාල යෝජනාව පිළිබඳව ලේකම්තුමිය විසින් කරුණු පැහැදිලි කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් බෝයවලාන උප කාර්යාල භූමියේ වගා කටයුතු සිදු කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය බීජ ලබා ගැනීමටත් වැය වන වියදම් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මට න්‍යාය පත්‍රය පිළිබඳව පුංචි ගැටළුවක් තිබෙනවා. පසුගිය මහා සභාවේදී අපේ ගරු මන්ත්‍රීවරු රාශියක් අත්සන් කර යෝජනාවක් බාර දී තිබුණා. ඔවුන් විසින් එය ලබන සභාවේ න්‍යාය පත්‍රයට යොමු කරන ලෙස ඉල්ලීමක් කලා. එය සභාවත් ඔබතුමියත් පිළිගත්තා. එසේ පිළිගත් එකක් අනිවාර්යයෙන්ම න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සභාපතිතුමියගේත් ලේකම්තුමියගේත් වගකීමක් සහ යුතුකමක් වෙනවා. එය පැහැර හැර තිබෙනවා.

<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය</u>
මේ සම්බන්ධයෙන් ලේකම්තුමියට පැහැදිලි කිරීමට අවස්ථාවක් ලබා දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, පවතින මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පවතින මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පවතින කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පවතින කාරක සභාව මහ සභාවක් බවට පත් විය.

ඉහත කාරක සභා අවස්ථාවේදී අදාල යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුලත් නොකිරීම සම්බන්ධයෙන් සභා රීති වල සදහන් කරුණු පිළිබඳව ලේකම්තුමිය විසින් කරුණු පැහැදිලි කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මම මෙම කාරණය මතු කලේ න්‍යාය පත්‍රයේ ප්‍රශ්නයක් ලෙසයි. එම යෝජනාවට අදාල කාරණය මේ වන විට අධිකරණයට යොමු කර තිබෙන ප්‍රශ්නයක්. එය නීත්‍යානුකූලව මෙසේ කතා කිරීමටත් නොහැකියි. මෙම යෝජනාව ප්‍රතික්ෂේප කිරීමට එක හේතුවක් ලෙස එය ප්‍රකාශ කලා නම් කිසිවෙකුටත් කතා කිරීමට දෙයක් නෑ. මෙය අවභාවිතා වීමක් ද නැද්ද යන වග එම අධිකරණ තීන්දුවත් එක්ක ඒවි. එම නිසා මෙම කාරණය හේතුකොට ගෙන අපි මේ සභාව අඩාල කරගැනීමට අවශ්‍ය වන්නේ නෑ. සභාපති කවුරු වුවත් සභාවේ කටයුතු නියමාකාරයෙන් කෙරෙන විට එතන විශ්වාසය ගොඩනැගෙනවා. මෙහිදී පටු ලෙස බලා කටයුතු නොකරන ලෙස මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. පසුගිය සභාවේදී ප්‍රකාශ කලා සේම ඔබතුමියගේ නිවසේ පෞරාණික බඩු පොඩිකර විනාශ කර තිබෙන අයුරු දුටු විට මට විශාල කණගාටුවක් සහ කලකිරීමක් ඇතිවුනා. පී.බී. වැත්තෑව මැතිතුමා යනු මේ ප්‍රදේශයේ බිහි වූ මහජන මන්ත්‍රීවරයෙක්. එතුමාගේ කාලයේ තරම් පරිත්‍යාගවන්තව කටයුතු කල කාලයක් තවත් නෑ. හඳපාන්ගල අක්කර 150, හෙණ්ඩුවාවත්ත අක්කර 150, නැබඩවතුර, පැපොල්ගස්ඉන්න අක්කර 65 ආදී වශයෙන් නැති බැරි මිනිසුන්ට බෙදා දෙන විට සත පහක දූෂණයක් සිදු වූයේ නෑ. කිසිදු චෝදනාවක් නොමැති හොඳම සේවයක් කල ජනතාව තලා පෙලා කටයුතු නොකල මහජන නියෝජිතයන්ගේ ගෙවල් කැඩීම අපරාධයක් නොවේදැයි මම ඔබෙන් අහනවා. ගෝල්ෆේස් එකේ අරගලයට පහරදීම අපි තරයේම හෙලා දකිනවා. නමුත් මේ ආකාරයට පෞද්ගලික දේපල විනාශ කිරීම පිළිකුලෙන් යුක්තව හෙලා දකිනවා. අපි මෙම ප්‍රශ්නය දුරදිග කතා කිරීම පලක් වන්නේ නෑ. අපිට කතා කිරීමට ගම් වල ජනතාවගේ ප්‍රශ්න ගොඩක් තිබෙනවා. අපිට අපේ ජනතාවට කිරීමට හැකි වැඩක් තිබෙනවා නම් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි මෙතනට පැමිණ සිටින්නේ ජනතාවට සේවය කිරීමටද නැතහොත් එක එක නායකයින් නායිකාවන් රැකීමටද යන්න මට සිතෙනවා. අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී එස්.එම්. ජයතිලක මැතිතුමාගේ ප්‍රකාශ පිළිබඳව මම කණගාටු වෙනවා. යසිත් මන්ත්‍රීතුමා ජනතා දේපලක් පිළිබඳව යෝජනාවක් ඉදිරිපත් කලා. මෙම කැබ් රථය පිළිබඳව ජනතාව අපෙන් අහන ප්‍රශ්න වලට උත්තර දීමට නොහැකියි. ජයතිලක මන්ත්‍රීතුමා කැබ් රථය අවභාවිතාවක් වී නොමැති බව එදා ප්‍රකාශ කලා. එය අධිකරණයේ තිබෙන ප්‍රශ්නයක් නිසා අපිට කතා කිරීමට අයිතියක් නොමැති බව අද එතුමා ප්‍රකාශ කරනවා. මේ ආකාරයට අපිට කිසිවෙක් රැකීමට අවශ්‍යතාවයක් නෑ. පොදු ජන පෙරමුණේ මන්ත්‍රීවරු 15 දෙනෙක් මෙතන සිටිනවා. ඇතැමුන්ට ඔබතුමිගේ විශේෂ සැලකිල්ලක් තිබෙන නිසයි මේ ගැටළු ඇතිවී තිබෙන්නේ. ඔබතුමිය සභාපති ධූරයට පත් වීමෙන් පසු චමින්ද වීරවංශ මන්ත්‍රීතුමා ගෙන ආ විශ්වාසය පළ කිරීමේ යෝජනාවේදී අපි සියළු දෙනා හදවතින්ම කතා කලා. අද මෙසේ කතා කිරීමට සිදුවීම පිළිබඳ කණගාටු වෙනවා. අද අපිට ගම් වල ජනතාවට වැඩක් කිරීමට අවස්ථාවක් නෑ. වීථි ලාම්පුවක් පවා සවි කිරීමට හැකියාවක් නෑ. අපි සභාවේ මෝටර් ග්‍රේඩරය, ජේසීබී එක ඉල්ලූ විට ඒවා තෙල් නොමැති බව ප්‍රකාශ කරනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රාදේශීය සභා වලින් දුර්වලම ප්‍රාදේශීය සභාව මෙම ප්‍රාදේශීය සභාවයි. ජනතාව රැකීමක් මිස මෙහිදී පුද්ගලයන් රැකීමක් නොවිය යුතු බව පොදු ජන පෙරමුණ වශයෙන් අපි ප්‍රකාශ කරනවා. ඔබතුමියන්ලාගේ ක්‍රියාකලාප නිසා අපිට අපේ පක්ෂයත්, අපේ නායකයොත් අපිට අපිත් නැතිවුනා. තවත් නැතිවීමට දෙයක් නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ගාමිණී සෙනරත් මැතිතුමා අවස්ථා 03 කදීම මගේ නම ප්‍රකාශ කලා. එතුමාට මා පැවසූ දෙය නොතේරීම පිළිබඳ මම කණගාටු වෙනවා. මේ සභාවේ නීතියක් රීතියක් නොමැති බව එතුමා ප්‍රකාශ කලා. ගැටළුව තිබෙන්නේ සභාවේ තිබෙන නීති රීති රකින්නේ නැති පිරිසක් පැමිණ සිටීමයි. එයට දොස් කිව යුත්තේ ආණ්ඩුවටයි. අපි කලින් සභාවට පත් වූ සෑම අවස්ථාවකදීම රීති මාලාව, ව්‍යවස්ථාව ආදිය පිළිබඳව පැහැදිලි කිරීමේ වැඩමුළු පැවැත්වූවා. නමුත් මෙවර එම අවස්ථාව අපේ නියෝජිතයින්ට අහිමි වුනා. සාධාරණය මගේ සිතට දැනෙනවා නම් මම එතනදී මගේ සිතත් සමඟ සිටිනවා. කවුරු චෝදනා කලත් එසේම මගේ සිතට එකඟව කටයුතු කිරීම එදත් අදත් හෙටත් සභාව නියෝජනය කරන තුරු එසේමයි. කණ්ඩායම් රැස්වීම් වල කතා කල යුතු දේ මෙතන කතා කරන්නට එපා. මසකට වතාවක් මෙම ස්ථානයට රැස්වන්නේ ගම් වල තිබෙන ප්‍රශ්න වලට යම්තාක් හෝ උත්තරයක් සෙවීමටයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙම ප්‍රශ්න සියල්ලක්ම ගොනු වී තිබෙන්නේ ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා අග්‍රාමාත්‍ය ධූරයෙන් සමුගැනීමේදී සිදු වූ ඛේදජනක සිදුවීම් රාශියක් සමඟයි. කෙසේ වෙතත් ගාමිණී මන්ත්‍රීතුමාගේ කතාව මගින් සැබෑවටම එය සභාවේ කැබ් රථයට හානි වීම පිළිබද ප්‍රශ්නයක් ද නැතහොත් මෙතන තිබෙන්නේ වෙනත් ප්‍රශ්නයක් ද යන කාරණය අපිට යතාර්ථවාදීව අවබෝධ වුනා. සභාවේ බලතල උදුරා ගන්නා සෑම අවස්ථාවකදීම මේ සභා ඉතිහාසයේ මම පෙනී සිටියා. ආණ්ඩු පක්ෂයේ ඉන්නවා වගේම කවදා හෝ විපක්ෂයට යන බවත් මතකයේ තබා ගන්නා ලෙස මම ආණ්ඩු පක්ෂයට පවසා තිබෙනවා. අපි අවුරුදු ගණනාවක දේශපාලන අවබෝධයත් සමඟ යම් යම් දේ දකිනවා. මෙතෙක් කාලයක් සභාපතිවරු ලිඛිත අවසරයන් වලට පමණක් නොව දුරකථන ඇමතුම් ලැබුණු අවස්ථා වලට ඕනෑ තරම් සහභාගී වී තිබෙනවා. එමෙන්ම මේ ගමන ගොස් තිබෙන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමා අග්‍රාමාත්‍යවරයාව සිටියදීයි. කැබ් රථය නවතා තිබුණේ අරලියගහ මන්දිරයේ පිටුපස ගේට්ටුව ලඟයි. එම නිසා ඔබතුමිය අරගලයට පහර දීමට ගිය බව මම විශ්වස කරන්නේ නෑ. එදා ගිය බහුතරයක් දෙනා ගෝල්ෆේස් අරගලයට පහරදීමට යන බව දන්නේ නෑ. මෙහිදී වාහනය අවභාවිතාවක් වී නොමැති බවත් සභාපතිවරයගේ ධූරය අනුව ඔබතුමිය කටයුතු කර තිබෙන බව මම මතක් කල යුතුයි. අධිහාරය සම්බන්ධව මෙතෙක් තීන්දුවක් අරගෙන නෑ. සභාපතිවරයාට වාහනය භාවිතා කිරීමට ඇති බලය අපි සීමා කරගන්නවා නම් අපි විසින් අපිම ඉදිරියට එන සභාපතිවරුන්ට වාහනය පාවිච්චි කිරීමට ඇති අයිතියත් අහිමි කර ගන්නා බව මතක් කල යුතුයි. එම නිසා අපි දේශපාලන න්‍යාය පත්‍ර සහ පුද්ගලික වුවමනාවන් මත කටයුතු නොකල යුතුයි. අරගලයට පහර දීම අපි හෙලා දකිනවා. මේ රටේ අපනයන ආර්ථිකය ගොඩදමන තෙක් විදේශ සංචිත ප්‍රමාණය ඉහළට ගෙනෙන තෙක් මේ රටේ කාටවත් ආණ්ඩු කර සාර්ථක විය නොහැකියි. ඔබතුමිය සභාවේ කැබ් රථයේ අරලියගහ මන්දිරයට යාම සම්බන්ධව නීතියේ වරදක් වී නොමැති බවත් අවභාවිතාවක් වී නොමැති බවත් මම පැහැදිලිව ප්‍රකාශ කරනවා.

**(05-3)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/51 - 03 දරණ යෝජනාව</u>**

පහත නම් සඳහන් අය දෛනික පදනම මත අප සභාවේ සේවය කරන අතර ඔවුන්ගේ ගිවිසුම් කාලය 2022 අගෝස්තු මස අවසන් වන බැවින් ඔවුන්ගේ සේවා කාලය දීර්ඝ කර ගැනීමට මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| නම | තනතුර | අවසන් දිනය |
|---|---|---|
| 1. එස්.එම්.සී.එච්. සෙම්බනායක | පුස්තකාල සහායක | 2022.08.12 |
| 2. ඩබ්.ඒ.ජී. වික්‍රමරත්න | ආදේශක සෞඛ්‍ය කම්කරු | 2022.08.10 |
| 3. ඩබ්.ඒ.සුජිත් ලසන්ත වික්‍රමසිංහ | ආදේශක සෞඛ්‍ය කම්කරු | 2022.08.06 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත අයගේ සේවා කාලය දීර්ඝ කර ගැනීමට මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-4)<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා විසින් කරනු ලබන අංක 06/51 - 04 දරණ යෝජනාව</u>**

2022 අයවැය ලේඛනයට අදාලව මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ මා විසින් 2022.01.10 දින යොමු කරන ලද නැබඩවතුර - ඕතර කිරුවම්පොල මාර්ගයේ බෝගමුව කුඹුරු සීමා කොටස තාර දමා සංවර්ධනය කිරීම - (රු. 300,000.00) යෝජනාව වර්තමානයේ පවතින පිරිවැය, භාණ්ඩ මිල ගණන් අනුව ඉටු කිරීමට අපහසු බැවින් එම යෝජනාව නැබඩවතුර - ඕතර කිරුවම්පාල මාර්ගයේ කුඹුරු සීමා කොටසේ අධික ලෙස මඩ වී ඇති අපහසු කොටස වැලි සෝදා ඉවත් කරන ලද බොරළු ගල් දමා සංවර්ධනය කිරීම - (රු. 300,000.00) ලෙස සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මෙම මාර්ගය දෛනිකව විශාල පිරිසක් ගමන් කරන මාර්ගයක්. නැබඩවතුර, බෝගමුව, ඕතර කිරුවම්පොල, ගොන්ගාවල, මඩවල, මහයාය යන මේ ගම් සියල්ලටම වෙනත් විකල්ප මාර්ගයක් නොමැති අතර ගමනාගමනය සඳහා භාවිතා කරනු ලබන්නේ මෙම මාර්ගයයි. මේ මාර්ගය ඉතා හොඳින් සංවර්ධනය වී තිබෙනවා. ඉතාම අපහසු කොටස වී තිබෙන්නේ මෙහි වෙල් සීමා කොටසයි. සභාවෙන් ලබා දෙන මුදලට අමතරව ග්‍රාම සංවර්ධන සමිතියෙන් මුදලුත් ලබා ගෙන තාර දමා සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබුනත් වර්තමානයේ පවතින භාණ්ඩ මිල ගනන් අනුව එය ඉටු කිරීම අපහසු වී තිබෙනවා. රට යථා තත්වයට පත් වී ආර්ථිකය වර්ධනය වීමෙන් පසු මෙම යෝජනාව ස්ථිර යෝජනාවක් ලෙස දැමීමට අවධානය යොමු කරමින් දැනට අයවැය ලේඛනයෙන් ලබා දී ඇති රු. ලක්ෂ 03 ක ප්‍රතිපාදන මුදලෙන් එම අධික ලෙස මඩවී ඇති අපහසු කොටස වැලි සෝදා ඉවත් කරන ලද බොරළු ගල් දමා සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව නැබඩවතුර - ඕතර කිරුවම්පොල මාර්ගයේ බෝගමුව කුඹුරු සීමා කොටස තාර දමා සංවර්ධනය කිරීම - (රු. 300,000.00) යෝජනාව නැබඩවතුර - ඕතර කිරුවම්පාල මාර්ගයේ කුඹුරු සීමා කොටසේ අධික ලෙස මඩ වී ඇති අපහසු කොටස වැලි සෝදා ඉවත් කරන ලද බොරළු ගල් දමා සංවර්ධනය කිරීම - (රු. 300,000.00) ලෙස සංශෝධනය කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-5)<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය විසින් කරනු ලබන අංක 06/51 - 05 දරණ යෝජනාව</u>**

2022 අයවැය ලේඛනයට අදාලව මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ මා විසින් ඉදිරිපත් කල යෝජනා පහත සඳහන් ආකාරයට සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

01. කණාමීවල ග්‍රාම සේවා වසමේ ගංවතුරෙන් හානියට පත්වූ මීයන්කුඹුර මාර්ගයේ අදාල ස්ථාන බොරළු දමා සංවර්ධනය කිරීම - (රු. 150,000.00)

02. නවතල්වත්ත ග්‍රාම නිලධාරී වසමේ ඉහළගම ගැමුණු මහතාගේ වෙල අසල කාපට් පාරේ සිට ඉහළට ඇති පාර කොන්ක්‍රීට් කිරීම - (රු. 350,000.00)

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය**

ගරු සභාපතිතුමියනි, මෙම මීයන්කුඹුර මාර්ගය මම මේ සභාවට ආපු දවසේ සිටම කතා කරන මාර්ගයක්. එම මාර්ගය සංවර්ධනය කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියෙන් මහ නැගුම හරහා ඇස්තමේන්තු සකස් කර තිබුනු අවස්ථාවකයි වර්තමාන ආණ්ඩුව අර්බුදකාරී තත්වයකට ඇද වැටුනේ. එම නිසා සභාවේ මන්ත්‍රී ප්‍රතිපාදන මුදලෙන් රු. 150,000.00 ක මුදලක් යොදා මෙම මාර්ගයේ ගංවතුරෙන් විනාශ වූ කොටස යථා තත්වයට පත් කර සංවර්ධනය කිරීමට මම සිතුවා. මම උත්සාහ කරන්නේ මෙම මාර්ගයේ පා ගමනින් හෝ යාමට හැකි තත්වයට පත් කිරීමටයි. මම බලාපොරොත්තු වූ එකම දෙය නම් මගේ කොට්ඨාශයේ පවතින මෙම මීයන්කුඹුර මාර්ගය සහ ප්‍රජා ශාලා මාර්ගය සංවර්ධනය කිරීමයි. වර්තමාන ආණ්ඩුවෙන් එම බලාපොරොත්තුව ඉටු වේ යැයි මම විශ්වස කරන්නේ නෑ. එම නිසා මෙම යෝජනාව සඳහා සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

මේ අවස්ථාවේ වගා සංග්‍රාමයට කටයුතු කිරීම සම්බන්ධයෙන් ලේකම්තුමිය හට ස්තූතිවන්ත වෙනවා. සභාවේ මුදල් වැය නොකර කාර්ය මණ්ඩලයේ ශ්‍රමය භාවිතා කර එම කාර්යය සාර්ථකව ඉටු කර ගැනීමට ඔබතුමිය ගන්නා වූ උත්සාහය සාර්ථක වේවා යි ප්‍රාර්ථනා කරනවා. එමෙන්ම සභාව හරහා යොමු කරනවා නම් අපේ කොට්ඨාශ වල ගම් මට්ටමින් මෙම වගා සංග්‍රාමය සිදු කිරීමට අපිටත් හැකියාව තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි මෙම මාර්ගයේ තාවකාලික නඩත්තු කිරීම් කලත් ස්ථිරසාරව සංවර්ධනය කිරීමට නොහැකි වුනා. මෙය විශාල ග්‍රාමීය ජනතාවක් භාවිතා කරන ඉතා අපහසු මාර්ගයක්. එම මාර්ගය පටු නිසා එයට විසඳුම් ලබා දීමට අපි එක් අවස්ථාවක කටයුතු කලා. මෙම මාර්ගය පළල් කිරීමට සියළු දෙනාම කැමති වී තිබෙන නිසා ඉතා කඩිනමින් ගමේ ජනතාවගේ සහයෝගය සහ ශ්‍රමය ලබා ගෙන අපේ සභාවේ සම්පත් ද යොදාගෙන එම කටයුත්ත සාර්ථකව ඉටුකර ගැනීමට අවස්ථාව ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා. වර්තමානයේ එවැනි කටයුතු සිදු වීම ඉතා අවම නිසා ප්‍රාදේශීය සභාව ජනතාව අතරට ගොස් තිබෙන්නේ ඉතාම මන්දගාමීවයි. එම නිසා මෙවැනි ආර්ථික අර්බුදයක් තිබෙන අවස්ථාවක ඒ ආකාරයට සියළු දෙනා එකතු වී සහයෝගය ලබා ගෙන මෙවැනි සංවර්ධන කටයුතු කිරීමට හැකි නම් සභාව පිළිබඳ ජනතාව තුල තිබෙන දුර්මතත් දුරු වී විශ්වාසයක් ඇති වේවි.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, රාජපක්ෂ මන්ත්‍රීතුමිය ඉතා දීර්ඝ කාලයක සිට මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඉතාම වෙහෙසක් දරනවා. එම නිසා මෙම කාරණයේදී විශේෂ අවධානයක් යොමු කොට සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රාජපක්ෂ මන්ත්‍රීතුමිය කටයුතු කිරීම පිළිබඳව බොහෝ සතුටු වෙනවා. ඒ සඳහා මගේ දායකත්වයත් එතුමියට ලබා දෙනවා. මේ ආකාරයටම එතුමියගේ කොට්ඨාශයට අයත් ඕබඩගෙදර මාර්ගයත් ගංවතුරෙන් විනාශයට පත් වී යාමට ඉතා අපහසු තත්වයක තිබුනා. මම එම කොටසට පස් යොදා යාමට හැකි තත්වයට සකස් කලා.

ඒ අනුව ඉහත සංවර්ධන කටයුතු සිදුකිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**06.** ඇස්තමේන්තු ඉදිරිපත් කිරිම - නැත

**07.**නිවාඩු ලිපි ඉදිරිපත් කිරිම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අද දින සභාවට සහභාගී නොවූ පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හට අද දිනය නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරීම ඒකමතිකව සභා සම්මත විය.

**08.**කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

**(08.1)** මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**
2022.06.07 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2022.06.07 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාවේ තීරණ අංක 01 - 1 ආවරණ අනු අංක 28 සහ අනු අංක 56 යටතේ වියදම් හැර ඉතිරි ගෙවීම් මේ සභාව පිළිගත යුතු බවට යෝජනා කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, අනු අංක 28 සහ අනු අංක 56 යටතේ යන වියදම් දෙක හැර ඉතිරි තීරණ මේ සභාව පිළිගත යුතු බවට ඒකමතිකව සභා සම්මත විය.

**09.** ප්‍රා.ස. **14** වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව හා ප්‍රා.ස **16** ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කිරීම

**9.1** ප්‍රා.ස **14** වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 මැයි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 මැයි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව, ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද අනු අංක 28 සහ අනු අංක 56 යටතේ වූ වියදම් සඳහා දැරූ වියදම් හැර පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 මැයි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව, ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද අනු අංක 28 යටතේ හා අනු අංක 56 යටතේ වූ වියදම් දෙක හැර පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>9.2 ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 මැයි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 මැයි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 මැයි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>10. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම</u>**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මුළු රටම ආර්ථික අර්බුදයක ගිලෙමින් තිබෙන මොහොතක එයට විසඳුම් සොයනවා වෙනුවට අපි වෙනත් දේ පිළිබඳව බොහෝ තර්ක විතර්ක ගෙනෙන බවකුයි මට මෙහිදී දක්නට ලැබුනේ.

අපේ ප්‍රදේශයේ ගෑස් බෙදා හරින ස්ථානයක් තිබෙනවා. මෙම බල ප්‍රදේශයේ අවශ්‍යතා සඳහා මොවුන් ගෑස් නිකුත් කරනවා නම් ගැටළුවක් නෑ. නමුත් මොවුන් පිට ප්‍රදේශ වලින් එන අයට වැඩි මිලට ගෑස් බෙදා හරිනවා. එමෙන්ම නගරයට ගෙනවිත් වැඩි මිලට අලෙවි කරනවා. හැකිනම් මෙම ක්‍රියාවට මැදිහත් වෙන ලෙස ඉල්ලා සිටිනවා.

එමෙන්ම ප්‍රදේශයේ සෑම තැනම වීථි ලාම්පු අක්‍රිය වී තිබෙනවා. ඒ සඳහා අවධානය යොමු කර නැවත එම වීථි ලාම්පු සක්‍රිය මට්ටමට ගෙන ඒමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ රටේ තිබෙන ආර්ථික අර්බුදයට විසඳුම් සෙවිය යුතුයි. ඒ සඳහා උද්ඝෝෂණ කිරීමෙන් ආර්ථිකය සකස් කල නොහැකියි. මේ අවස්ථාවේ ජනතාව වෙනුවෙන් සියළු පක්ෂ එකතු විය යුතුයි. අපිට විදේශ විනිමය ගෙන ඒමට නම් සංචාරක ව්‍යාපාරය, විදේශ

ශ්‍රමික ප්‍රේෂණ, අපනයන ආදායම, විදේශ ආයෝජන තුලින් ඩොලර් ඉපයිය යුතුයි. එමෙන්ම උද්ඝෝෂණ කිරීම නොව අපි වගා සංග්‍රාමයට උදව් කල යුතුයි. උද්ඝෝෂණ කිරීමෙන් තවදුරටත් පීඩාවට පත් වන්නේ අහිංසක ජනතාවයි. දැනුමක් අධ්‍යාපනයක් නොමැති දේශපාලඥයින් රටට කල හානිය හේතුවෙන් අපේ රට ඉතා දුප්පත් රටක් බවට පත් වී තිබෙනවා. මේ මොහොතේ දේශපාලනයෙන් ඵලක් නැහැ. ධනාත්මකව මේ රටේ ආර්ථිකය ගොඩනැගෙන ආකාරයේ වැඩපිළිවෙලක් ගෙන ආ යුතුයි. දේශපාලඥයින් මේ මොහොතේ කටයුතු කල යුත්තේ ඉතාමත් මානව හිතවාදී ලෙසයි. අපේ ප්‍රාදේශීය සභාවේ වීථි ලාම්පු අළුත්වැඩියා කරන්නේ නෑ. කාණු කැටයක් ලබා දෙන්නේ නෑ. අපි විල්ගමුවත්තට ජේසීබී එක ඉල්ලුවත් එය ලැබුනේ නෑ. එම නිවෙස් වලට යාමට තාමත් මාර්ගයක් නෑ. අපේ ප්‍රදේශයේ දියුණුව වෙනුවෙන් අපි වැඩ කල යුතුයි. ඒ සඳහා ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අද අපේ රට විශාල ආර්ථික අර්බුදයකට ලක් වී තිබෙනවා. එමෙන්ම ආහාර අර්බුදයකුත් රට තුල ඇතිවෙමින් පවතිනවා. ප්‍රාදේශීය සභාවක් ලෙස අපි අපේ බලප්‍රදේශයේ ජනතාව එම තත්වයෙන් මුදවා ගැනීමට විවිධ තීන්දු තීරණ වලට එළඹිය යුතුයි. පසුගිය කාලයේ මිනිසුන්ට ගමන් කිරීමට අපහසු මාර්ගයන් හදනවා වෙනුවට හොඳින් ගමන් කල හැකි හොඳ තත්වයේ මාර්ග කොන්ක්‍රීට් හෝ කාපට් කලා. එය ඉතා ඛේදජනකක සිදුවීමක් ලෙස මා දකිනවා. නමුත් අපි විපක්ෂ කණ්ඩායමක් ලෙස අපිට ලැබුණු මුදල් වලින් ගමන් කිරීමට අපහසු මාර්ග හැදුවා. එදා බොහෝ අය හොරකම, වංචාව සිදු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අද අපි විශාල ආර්ථික අර්බුදයකට මුහුණ දී තිබෙනවා. දැන් අපි මේ සභාව තුල දේශපාලන පක්ෂ මත පිල් බෙදා ගැනීමෙන් ඵලක් නැහැ. කුමන හෝ මන්ත්‍රීවරයෙකු හොඳ යෝජනාවක් ගෙන ආ විට අපි ඒවා අගය කල යුතුයි. මේ ප්‍රදේශයේ ජනතාවට ස්වයංපෝෂිත ආර්ථිකයක් ළඟා කර ගැනීමට අපිට බොහෝ දේවල් කල හැකියි. එම නිසා අපි හොඳ යෝජනා මාලාවක් ඉදිරිපත් කර ප්‍රදේශයේ ජන ජීවිතය නගා සිටුවීමට කටයුතු කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශීය ලේකම්වරියක් සිටින නමුත් අත්‍යාවශ්‍ය කටයුතු සඳහා එතුමියගේ කැපවීමක් නොමැති බව පෙනෙනවා. 89 අවුරුද්දේ මෙලෙසම රටේ ප්‍රශ්න ඇති වූ අවස්ථාවේ අලව්ව බල ප්‍රදේශයේ එවකට දේශපාලන අධිකාරිය තීන්දු තීරණ ගැනීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරයාට භාර කලා. අලව්ව නගර සීමාව තුල අලව්ව සති පොලට බඩු ප්‍රවාහනය කරන ලොරි රථ, තොග බඩු ප්‍රවාහනය කරන ලොරි රථ සහ කෘෂිකාර්මික කටයුතු වලට සම්බන්ධ වන සියළුම ට්‍රැක්ටර් රථ වලට ඉන්ධන ලබා දීමේදී ප්‍රමුඛස්ථානය ලබා දිය යුතු බවට නීතියක් දැමුවා. කවදා හෝ නගරය විවෘත කල දිනට අත්‍යාවශ්‍ය බඩු ටික ලබා ගැනීමට මේ තුලින් වැඩපිළිවෙලක් සකස් කර තිබුනා. ගෑස් ප්‍රශ්නය අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස එහි වගකීම භාරගත යුත්තේ ප්‍රාදේශීය ලේකම් විසිනුයි. ලැබෙන ඉතා සුළු ගෑස් ප්‍රමාණය වෙළඳ මහතුන් විසින් ප්‍රමුඛතා ලේඛනයකට ලබා දුන්නත් හොර රහසේ වැඩි මුදලට ගෑස් ලබා දෙනවා. එම නිසා ඔබතුමිය ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කර නිසි ක්‍රමවේදයක් මේ සඳහා සකස් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. නිලධාරී වාදයත් සමඟ ඇති වූ ප්‍රතිඵලයට අපි දැන් මුහුණ දී තිබෙනවා. අත්‍යාවශ්‍ය සේවා ලබා දීමේදී ප්‍රාදේශීය ලේකම්තුමිය සමඟ සාකච්ඡා කර ඇති වී තිබෙන ගෑස්, තෙල් අර්බුදයට විසඳුම් ලබා ගැනීම සඳහා කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. අලව්ව බල ප්‍රදේශයේ ජනතාව මොනතරම් ඉන්ධන අර්බුධයක් තිබුනත් මෙතෙක් කාලයකට පාර වැසුවේ නෑ. එම ජනතාවට හොඳ විනයක් තිබෙනවා. මේ බල ප්‍රදේශයේ ජනතාවට ඇති වී තිබෙන ප්‍රශ්න විසඳීම සඳහා අපි සියළු දෙනා සම්මුතියකට පැමිණ නිවැරදි තීන්දු තීරණ වලට එළඹෙමු යැයි ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව රෝහලේ ගිලන් රථයට අවශ්‍ය සුපර් ඩීසල් නොමැති වීම නිසා රෝගීන් මාරු කර යැවීමට අපහසු වී තිබෙනවා. මේ සඳහා ඔබතුමිය හෝ මැදිහත් වී සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඉතාම වැදගත් යෝජනා කිහිපයක්ම වෙනත් කරුණු යටතේ ඉදිරිපත් වුනා. රාජ්‍ය නිලධාරීනුත් අද කාර්යක්ෂම නොමැති තත්වයට පත් වී තිබෙනවා. ඔවුන් තෙල් නැති බව ප්‍රකාශ කරමින් රාජකාරිය පැහැර හරිනවා. මම මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්තුමියත් දැනුවත් කලා. රාජ්‍ය යාන්ත්‍රණය ඉතා වේගවත්ව ක්‍රියාත්මක විය යුතු වේලාව මෙයයි. එම නිසා ඒවාට විකල්ප ඉතා කඩිනමින් යෙදිය යුතුයි. සාමාන්‍ය පුද්ගලයින්ට එහා ගිය ඉතා හොඳ බුද්ධිමත් පිරිසක් වියත් මග ලෙස බලයට ගෙනවිත් අද අසාර්ථක වී තිබෙනවා. මගේ පෞද්ගලික මතය නම් දේශපාලනය යනු වෙනත්ම පැතිකඩක් බැවින් ඒ සඳහා සමාජය නමැති විශ්ව විද්‍යාලය තුල ඉහළ දැනුමක් තිබිය යුතුවා මිස උපාධියකින් ලැබෙන දැනුමක් එහි පලක් වන්නේ නෑ. මේ රටේ තිබෙන අර්බුදයට බොහෝ හේතු වූයේ රටේ නායකයින් ජනතාවගේ හඬට කන් නොදීමයි. මේ රටේ ආණ්ඩු වලට දීර්ඝ කාලීන සැලැස්මක් තුල ක්‍රියාත්මක වීමට අවස්ථාව ලැබුනේ නෑ. එයට හේතුව නම් මාධ්‍ය සහ සමාජ මාධ්‍ය ජාල විසින් මෙම ආණ්ඩු සියල්ලම සුන්නද්ධූලි කර දමා තිබෙනවා. සමාජ මාධ්‍ය අද රට පාලනය කරන තත්වයට පැමිණ තිබෙනවා. මේ රටේ දැවැන්ත වංචා දූෂණ සිදුවන්නේ රාජ්‍ය නිලධාරී යාන්ත්‍රණය තුලයි. දේශපාලන නායකයින් ගන්නා තීන්දු ක්‍රියාත්මක කරන්නේ ඔවුන් විසිනුයි. සෑම දේශපාලඥයෙක්ම හොරෙක් ය යන මතය ජනතාව තුල ඇති කර තිබෙනවා. එහි වාසිය ජනතා විමුක්ති පෙරමුණ අරගෙන තිබෙනවා. මේවා විසඳිය යුත්තේ විමුක්ති අරගලයකිනුයි. එයට සමාජ ප්‍රතිසංස්කරණ අවශ්‍යයි. ඒ අනුව රට ගොඩනැගීමට කටයුතු කිරීම සඳහා සියළු දෙනාටම වගකීමක් තිබෙනවා. පදනම් විරහිතව චෝදනා කිරීමට ගොස් දේශපාලඥයාගේ ගෞරවනීය භාවය දේශපාලඥයා විසින්ම කෙලෙසගෙන තිබෙනවා. අපි ඉතාම බුද්ධිමත්ව සමාජ මතයට හිස නමා කටයුතු කල යුතුයි. නැතහොත් ඊලඟ මැතිවරණයේදී ප්‍රතික්ෂේප වීම සිදුවෙනවා. ඇතැම් රාජ්‍ය නිලධාරීන් සොරකම්, වංචා සිදු කරමින් හොරු එළවමු යැයි බෝඩ් ඔසවාගෙන උද්ඝෝෂණ කරනවා. දේශපාලඥයින් ඔය කියන තරම් හොරකම් කරලා නැහැ. අද දේශපාලඥයන් පිළිබඳව නොව රාජ්‍ය නිලධාරියාගේ හොරකම් පිළිබඳව කතා කල යුතු කාලයක් වී තිබෙනවා. අද මේ රටේ තිබෙන තත්වයට බොහෝ දුරට මාධ්‍ය ආයතන වගකිව යුතුයි. මාධ්‍ය තුලින් ජනතාව තුල ධනාත්මක දෙයට වඩා ඍණාත්මක මානසික මට්ටමක් ඇතිකර තිබෙනවා. අපේ රට ගොඩගැනීම සඳහා මේ ණය උගුලෙන් ගැලවීමට නම් විමුක්ති අරගලයක් කල යුතු වුවත් එය දැන් තිබෙන අරගලය නම් නොවෙයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඉතාම හොඳ කරුණු කීපයක් පිළිබඳව වෙනත් කරුණු යටතේ මතුකරනු ලැබුවා. අපේ ජීවිත කාලයේදී මේ රට තුල මෙවැනි අර්බුදකාරී තත්වයක් ඇති වී නැහැ. අද මුළු රටම ඉතාම අවාසනාවන්ත තත්වයට පත් වී තිබෙනවා. චමින්ද වර්ණසූරිය මන්ත්‍රීතුමා ප්‍රකාශ කලා සේම රටේ සෑම පුරවැසියෙකුටම වගකීමක් සහ යුතුකමක් තිබෙනවා. රටේ අභාග්‍ය වී තිබෙන්නේ එය තේරුම් නොගැනීම නිසයි. ප්‍රාදේශීය සභාවක් ලෙස අපි වීථි ලාම්පු නඩත්තුව පිළිබඳව අවධානය යොමු කල යුතුයි. අපේ බලප්‍රදේශයේ මාර්ග වල දහවලත් වීථි පහන් දැල්වෙන බව දැනගන්නට ලැබෙනවා. බල ප්‍රදේශයක් තුල තිබෙන මාර්ගයක එසේ විදුලිය අපතේ යනවා නම් මුළු රට තුල විදුලිය කෙතෙක් අපතේ යනවා දැයි සිතාගත හැකියි. ඒ පිළිබඳව ඔබතුමියගේ නිසි අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. එමෙන්ම ඉදිරියේදී ඇතිවන ආහාර අර්බුදය පිළිබඳ අනතුරු අඟවා තිබෙනවා. එයට මුහුණ දීම සඳහා ජනතාවත් එකතු කරගෙන ප්‍රාදේශීය සභාව මගින් යම් දායකත්වයක් සැපයිය හැකි නම් එය ඉතා කාලෝචිතයි. ඒ පිළිබඳව අවධානය යොමු කර බෝයවලාන පුස්තකාල භූමියේ වගා භූමියක් ආරම්භ කිරීමට

කටයුතු කිරීම ඉතාම හොඳ ක්‍රියාවක්. ඒ ආකාරයට ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් තිබෙනවා නම් ඒවා වගා කිරීම සඳහා කාට හෝ බදු ලබා දීමත් කල හැකියි. එමෙන්ම සභාව මගින් ගෙවතු වගාව සඳහා ජනතාව යොමු කර ඊට සහයෝගය ලබා දීමත් කල හැකියි. එවැනි වැඩපිළිවෙලවල් තුලින් මෙම අවාසනාවන්ත කාලය වාසනාවන්ත කාලයක් බවට පත් කර ගැනීමේ හැකියාව තිබෙනවා. මේ සියළු දෙනාම එකට එක් වී රට මේ තත්වයෙන් මුදවා ගැනීමට ජාතික ප්‍රතිපත්තියක් සකස් කර මැතිවරණයට සුදුසු වාතාවරණය සකස් කරගෙන මැතිවරණයකට යාමයි සිදු විය යුත්තේ. ප්‍රාදේශීය සභාවට තිබෙන හැකියාව අනුව මෙවැනි තත්වයක් තුල ජනතාවගේ අභිවෘද්ධිය සඳහා යමක් කිරීමට හැකිනම් ඒ සඳහා අපි සියළු දෙනාම පක්ෂ පාට භේදයකින් තොරව අත්වැල් බැඳගමු යැයි ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ගෑස් සම්බන්ධ ගැටළුව ගතහොත් එය මේ ප්‍රදේශයේ ක්‍රියාත්මක වන මාෆියාවක් බවට පත් වී තිබෙනවා. ඒ පිළිබඳව වගකිව යුතු තැන් දැනුවත් කලත් මෙතෙක් කිසිදු පිළිතුරක් ලැබී නෑ. අපිට සභාවක් වශයෙන් ඒ සම්බන්ධව යමක් කල හැකි නම් එය ඉතාමත් වටිනවා. අද වන විට මෙම ගෑස් ප්‍රශ්නයත් ආහාර ප්‍රශ්නයත් රට තුල අර්බුදකාරී තත්වයක් මතු කිරීමට හේතු වී තිබෙනවා. ගෑස් ප්‍රශ්නයට විසඳුමක් ලෙස පොල්කටු ලිපක් හඳුන්වා දී තිබෙනවා. එය ඉතාම සාර්ථක විසඳුමක් ලසා පෙනෙනවා. අපි මසකට වතාවක් මෙම ස්ථානයට පැමිණ වෙනත් කරුණු කතාකර ආපසු ගොස් එලක් වන්නේ නෑ. මේ ප්‍රදේශයේ ජනතාවගේ උන්නතිය උදෙසා අපි කටයුතු කල යුතුයි. නැතහොත් අපිට සිදු වන්නේ රජයට සිදු වූ දෙයමයි. එම නිසා අපි මේ ප්‍රදේශයේ උන්නතිය උදෙසා කටයුතු කරමුයි ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි  වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, අද වැදගත් යෝජනා කිහිපයක් සභාවට ඉදිරිපත් වුනා. අද රට පත්ව ඇති තත්වය තුල කාන්තාවන් ලෙස අපිටත් යමක් කිරීමේ හැකියාව තිබෙනවා. ඉදිරියේදී අපිට දැඩි ආහාර අර්බුදයකට මුහුණ දීමට සිදු වන බව පෙනෙනවා. අතීතයේ මෙන් කොස්, දෙල් අටු කොස් කර තබා ගැනීම වැනි දේ තුලින් ඉදිරියේදී ආහාර අර්බුදයට සාර්ථකව මුහුණ දිය හැකියි. නමුත් මේ සඳහා තරුණ මවුවරුන් මෙතෙක් පෙළ ගැසී නොමැති බව පෙනෙනවා. එම නිසා සභාව මගින් එවැනි දේ ට තරුණ කාන්තාවන් යොමු කිරීමට හැකි නම් එය ඉතාමත් වටිනවා.

අද රටේ සිටින තරුණ පිරිසට නිසි මග පෙන්වීමක් නැහැ. පාසල තුලින් වුවත් දැනුම, කුසලතා සහ ආකල්ප යන තුනම දරුවෙකු තුල ඇති කල යුතුයි. නමුත් අද මේ තරුණ දරුවන් තුල ඇත්තේ දැනුම පමණයි. අද සමාජය මෙසේ පරිහානියට ගොස් තිබෙන්නේ මෙම ආකල්ප සංවර්ධනය නොවීම හේතු කොගෙනයි. එසේ ආකල්ප සංවර්ධනය වූ පිරිසක් මේ රට තුල සිටියා නම් එදා ගෙවල් ගිනි තැබීමට හෝ පහර දීමට පෙළඹෙන්නේ නෑ. එදා ඔබතුමියගේ නිවසට අලාභහානි කිරීම සම්බන්ධයෙන් මම බොහෝ කණගාටු වෙනවා. එම විනාශ කල දේපළ ඔබතුමියගේ පියා හෝ ඔබතුමිය හෝ සොරකම් කර හම්බ කරගත් දේපළ නොවන බව අපි හොඳින්ම දන්නවා.

අනෙක් ප්‍රාදේශීය සභා සමඟ සසඳා බැලීමේදී අපේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරු විපක්ෂයේ අපිටත් වීපී ලාම්පු මෙන්ම ප්‍රතිපාදන ලබා දුන්නා. මෙතෙක් අපි පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එකමුතුව කටයුතු කලා. නමුත් දැන් පුංචි පුංචි ප්‍රශ්න ඇතිවෙමින් යන බව පෙනෙනවා. ඒ සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, වෙනත් කරුණු යටතේ කතා කලේ සභා වාර්තාවට ඇතුලත් විය යුතු යෝජනා බවයි මගේ හැඟීම. රට පත්ව තිබෙන දුෂ්කර වාතාවරණය තුල එයින් ජනතාව මුදවා ගැනීමට අලව්ව ප්‍රාදේශීය සභාවට කල හැක්කේ කුමක්ද යන්න අපි කතා කරන්නේ වෙනත් කරුණු යටතේයි. ජනතා නියෝජිතයින් ලෙස අපි මෙම ස්ථානයට පැමිණෙන්නේ ජනතාවට

සේවය කිරීමට නම් ජනතාවගේ ගැටළු සඳහා කල හැකි දේ පිළිබඳව මෙම න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීමට අපි කටයුතු නොකරන්නේ මන්ද ? අපි පක්ෂ විපක්ෂ භේද පසෙක තබා මහජන නියෝජිතයින් ලෙස සියළු දෙනා එක් වී ගම් මට්ටමින් අපිට ජනතාව මෙම පීඩනයෙන් මුදවා ගැනීමට කල හැකි දේ කර ගෙවතු වගා සංග්‍රාමය මෙන්ම සභාව සතුව තිබෙන භූමි වගා කල හැකි පුද්ගලයින් යොදවා වගා කිරීම කල හැකියි. අපේ ගම් වල පුරන් වී ගිය කුඹුරු තිබෙනවා. ඒවා වැඩ කිරීමට ක්‍රමවේදයක් යෝජනා කල යුතුයි. රට ගොඩනැගීමට නම් උද්ඝෝෂණ හෝ කලකෝලහාල කිරීමෙන් ඵලක් නෑ. කෙදිනක හෝ පවතින්නේ අපි කල හොද පමණයි.

එමෙන්ම බොහෝ කාලයක සිට මා ඉල්ලා සිටින ඉල්ලීමක් තිබෙනවා. එනම් හුම්බුළුව කලල්පිටිය මාර්ගය මැනුම් කටයුතු කිරීමයි. තාක්ෂණ නිලධාරී මහතෙකු යොමු කර එම මාර්ගය ගැසට් නිවේදනයට අනුව මැනුම් කටයුතු කිරීම සඳහා සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

වෙනත් කරුණු යටතේ ඉතා වටිනා අදහස් කිහිපයක්ම ඉදිරිපත් වුනා. ඒවා ක්‍රියාත්මක කර ගැනීමට අපි සියළු දෙනා පෙළගැසෙමු. තෙල් අර්බුදය අපි නොසිතූ වෙලාවක මුළු ලංකාවටම බල පෑ කාරණාවක්. අපිට පසුගිය කාලයේ ඉන්ධන ලබා දුන්නේ ලීටර් 150 ක් පමණයි. අපේ කසළ අදින කම්පැක්ටර් රථයට සතියකට ලීටර් 150 ක් අවශ්‍යයි. ඒ අනුව ලැබෙන තෙල් ප්‍රමාණය එම රථයට යෙදීමෙන් පසු අනෙක් වාහන වලින් වැඩ කිරීමට නොහැකියි. වීථි ලාම්පු එකක් දෙකක් සකස් කිරීම සඳහා වාහනය යැවීම සීමා කලේ එම නිසයි. දැනට එක් බවුසරයකින් ලීටර් 200 ක් අපිට ලබා දෙනවා. ඒ අනුව අනෙක් වාහන වලට ඉතිරි වන්නේ ලීටර් 50 ක් පමණයි. විදුලි අර්බුදයත් තිබෙන නිසා ඉදිරියේදී එක් දවසක එක් ප්‍රදේශයකට එකවර යාමට සැලසුම් සකස් කරමින් තිබෙනවා. කෙසේ වෙතත් අත්‍යාවශ්‍ය තැන් වලට මෙතෙක් කාලයක් අපි විදුලි පහන් දමනු ලැබුවා. ඔබතුමන්ලාගේ යෝජනා ගොනු කරගෙන අපි එක සැලැස්මක් සකස් කරගෙන ඉදිරියේදී කටයුතු කරමු. අපි සභාවක් ලෙස ගම් මට්ටමින් කල හැකි පුංචි පුංචි දේවල් හෝ කිරීමට සැලැස්මක් සකස් කරගෙන මන්ත්‍රීතුමන්ලාගේ අදහස් උදහස් ලබාගෙන කටයුතු කරමු.

අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ඡා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වූ උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තූතිය පල කරනවා.

අද දිනට නියමිත සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 1.00 ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

2022/06/15
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.